අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழு
COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION

# ලංසු සඳහා ආරාධනයයි

## මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ කාර් රථ දෙකක්(02)ක් ලබා ගැනීම.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ කාර් රථ දෙකක්(02) ලබා ගැනීම සඳහා සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රිත මිල ගණන් කැඳවනු ලැබේ.

**<u>කොන්දේසි හා නියමයන් :</u>**

01. (i). වාහන වර්ගය :- උපරිම එන්ජින් ධාරිතාවය 1600 CC වන කාර් රථ
    (ii). මේ සඳහා කාර් රථ දෙකටම හෝ එකක් සඳහා වුවද මිළ ගණන් ඉදිරිපත් කර හැක.
02. වාහන තත්වය : -වාහන අළුත්ම තත්වයේ ඒවා හෝ කුලියට ගන්නා අවස්ථාවේදී ධාවන දුර ප්‍රමාණය කි.මී.100,000ට නොවැඩි වාහන විය යුතුය.
03. කොන්ත්‍රාත් කාලය :- මාස හැටක්(60)
04. සුදුසුකම්ලත් සැපයුම්කරුවන්, මෝටර් රථ කුලියට ලබාදීමේ සේවාවන් පවත්වාගෙන යන ආයතනයක් හෝ පුද්ගලයෙකු විය යුතුය.
05. සැපයිය යුතු සේවාවන්:- හදිසි අනතුරු අළුත්වැඩියා වියදම් සැපයුම්කරු විසින් දැරිය යුතුය. අළුත්වැඩියා හා නඩත්තු කටයුතු සඳහා පැය 24 කට වඩා වැඩි කාලයක් ගතවන්නේ නම් සැපයුම්කරු විසින් එම වාහනයට සමාන තත්වයේ වාහනයක් ලබාදිය යුතුය.

වැඩි විස්තර 2024/03/12 දින දක්වා සතියේ දිනවල පෙ.ව.9.00 සිට ප.ව.3.00 අතර අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ගණකාධිකාරි(ප්‍රසම්පාදන)ගේ දුරකථන අංක 011-2588004 මගින් ලබා ගත හැකිය.

ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද නියමිත ලංසුපත් 2024/02/19 දින පෙ.ව.9.00 සිට 2024/03/12 දින ප.ව.2.00 දක්වා ආපසු නොගෙවනු ලබන රුපියල් 3,000.00ක තැන්පතුවක් ගෙවා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ප්‍රධාන ගණකාධිකාරී වෙත ලිඛිතව ඉල්ලීමක් කිරීමෙන් ලබා ගත හැකිය.

නැවත නොගෙවනු ලබන තැන්පතු මුදල කොළඹ 07, මලලසේකර මාවත, අංක 36 හි පිහිටි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නව ගොඩනැගිල්ලේ 03වන මහලෙහි සරප් වෙත මුදලින් ගෙවිය යුතුය.

නිසියාකාරව සම්පූර්ණ කරන ලද ලංසු සභාපති, ප්‍රසම්පාදන කමිටුව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, අංක 36, මලලසේකර මාවත, කොළඹ 07 ලිපිනයට 2024/03/12 දින ප.ව.2.00ට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ මෙම කොමිෂන් සභාවේ ගිණුම් අංශයෙහි තබා ඇති ලංසු පෙට්ටියට දැමීම කල හැකිය. මිළ ගණන් ඇතුලත් කවරයේ වම් පස ඉහල කෙලවරේ “මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ කාර් රථ 02ක් ලබා ගැනීම” යනුවෙන් සඳහන් කල යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු භාරගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලංසු භාර ගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කරනු ලබන අතර එම අවස්ථාවට ඔබට හෝ ඔබගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගි විය හැකිය.

සභාපති - ප්‍රසම්පාදන කමිටුව
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
අංක 36, මලලසේකර මාවත,
කොළඹ 07.
දුරකථන - 0112582864, 0112596365 ෆැක්ස් - 0112058346